// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2228/28 - 2021 මැයි මස 19 වැනි බදාදා - 2021.05.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 6 වන සංශෝධනය

ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ සේවා ව්‍යවස්ථාව

අංක 1882/18 හා 2014 ඔක්තෝම්බර් 01 දිනැති, අංක 1952/20 හා 2016 පෙබරවාරි 02 දිනැති, අංක 1994/68 හා 2016 නොවැම්බර් 24 දිනැති, අංක 2085/46 හා 2018 අගෝස්තු 24 දිනැති, සහ අංක 2137/88 හා 2019 අගෝස්තු මස 23 දිනැති, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍ර* මගින් සංශෝධිත අංක 1877/28 හා 2014 අගෝස්තු 28 දිනැති, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දැක්වෙන ආකාරයට සංශෝධනය කරනු ලබන අතර, එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

එම්. ඒ. බී. දයා සෙනරත්,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2021 මාර්තු මස 16 වැනි දින.

| | | |
|---|---|---|
| 7.2.2.4 | කායික සුදුසුකම් | : ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට මෙන්ම තම තනතුරේ භූමිකාව හා කාර්යභාරය හොඳින් ඉටුකිරීමට අවශ්‍ය ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය. |
| 7.2.2.5 | වෙනත් | : අනු අංක III වගන්තිය ඉවත් කරනු ලැබේ. |
| 7.2.4 | බඳවා ගැනීමේ ක්‍රමය | : ලිඛිත විභාගයක හා සමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත |

ලිඛිත විභාගය සමත් අදාළ සුදුසුකම් සම්පූර්ණ කරන ලද අපේක්ෂකයින්ගේ ලකුණු වල කුසලතාවයේ අනුපිළිවෙල හා මනාපය සැලකිල්ලට ගෙන බඳවා ගනු ලැබේ. තනතුරට බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන සංඛ්‍යාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

7.2.4.1 ලිඛිත විභාගය

විවෘත ධාරාව යටතේ බඳවා ගැනීමට අදාළ ලිඛිත තරග විභාගය සම්බන්ධ කරුණු 2 වන පරිශිෂ්ඨයේ සඳහන්ව ඇත.

7.2.4.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කරනු ලබන අතර ලකුණු ලබා දීමක් සිදු නොවේ.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

7.3.2.3

II. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

10.1.1.1.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

10.2.1

II. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

10.3.1

VI. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

2 වන පරිශිෂ්ඨය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් 2 වන පරිශිෂ්ඨය ආදේශ කරනු ලැබේ.

## 2 වන පරිශිෂ්ඨය

විවෘත ධාරාව යටතේ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ තුන්වැනි (III) ශ්‍රේණියට බඳවා ගැනීම
සඳහා පවත්වනු ලබන ලිඛිත තරඟ විභාගය

රජයේ විධායක නිලධර ගණයේ III ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම සඳහා වන පොදු තරඟ විභාගය මේ සඳහා අදාළ වේ. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් වාර්ෂිකව පැවැත්වීමට කටයුතු කරනු ඇත.

**01. විභාග පරිපාටිය**

| ප්‍රශ්න පත්‍රය | කාලය | ප්‍රශ්න පත්‍රයේ ස්වභාවය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 1/2 | ලකුණු 100, බහුවරණ ප්‍රශ්න සහ / හෝ කෙටි ප්‍රශ්න වලින් සමන්විත වේ. | 40 |
| අවබෝධය | පැය 02 | ලකුණු 100, බහුවරණ ප්‍රශ්න සහ / හෝ කෙටි ප්‍රශ්න වලින් සමන්විත වේ. | 40 |

**02. විෂය නිර්දේශය**

**බුද්ධි පරීක්ෂණය**

අපේක්ෂකයා සතු තර්කනය, ආදේශනය, අර්ථකථනය, සම්බන්ධතා දැකීම, පරිවර්තනය, ගැටළු විසඳීමේ හැකියාව, හේතුඵල සම්බන්ධතා අවබෝධ කර ගැනීම, පුරෝකථනය, තොරතුරු සංවිධානය, රටා හඳුනා ගැනීම සහ උපදෙස් පිළිපැදීම ආදී හැකියා මැනීම සඳහා සකස් කරනු ලබන බහුවරණ වර්ගයේ ප්‍රශ්නවලින් යුක්ත වේ.

**අවබෝධය**

අපේක්ෂකයා සතු කරුණු අවබෝධ කරගැනීමේ හැකියාව, සන්නිවේදන කුසලතා, සාරාංශකරණය, විවරණය හා නිර්මාණාත්මක බව ආදී කුසලතා මැනීම සඳහා සකස් කරනු ලබන වාස්තවික ප්‍රශ්නවලින් යුක්ත වේ.

**03. විභාග මාධ්‍යය**

I. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පැවැත්වේ.
II. අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකිය.
III. අපේක්ෂකයින් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුතු අතර ඒ සඳහා එක් භාෂා මාධ්‍යයක් පමණක් තෝරා ගත යුතු ය.
IV. අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

06 - 35

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.